

LANKA SATHOSA

GRACEFULLY FORWARD

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2011


**සීමාසහිත ලංකා සතොස**

සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**லங்கா சதொச லிமிடட்**

நவீன வர்த்தகத்தின் தனிச் சிறப்பு

**Lanka Sathosa Limited**

A unique take on modern trade

# පටුන

| | |
|---|---|
| සංස්ථාපිත තොරතුරු | 1 |
| දැක්ම, මෙහෙවර හා අභිමතාර්ථ | 2 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 3 |
| අධ්‍යක්ෂතුමාගේ වාර්තාව | 4 |
| සංස්ථාපිත පාලනය | 5 |
| මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා | 6 - 7 |
| අගය එකතු කළ ප්‍රකාශනය | 8 |
| ස්වාධීන විගණන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන | 9 - 23 |

# සංස්ථාපිත තොරතුරු 2011

| | |
|---|---|
| ආයතනය | - සීමාසහිත ලංකා සතොස |
| ලියාපදිංචි ලිපිනය | - අංක 108, නිග්‍රිරිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය කොළඹ 01 |
| නෛතික තත්ත්වය | - 2007 අංක 07 දරණ සමාගම් ආඥාපණත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත පූර්ණ රාජ්‍ය සමාගමකි. |
| සමාගමේ ලියාපදිංචි අංකය | - පී බී 1326 |
| ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය | - අංක 108, නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය කොළඹ 01<br>දුරකථන - 94-11-2436301 -2<br>ෆැක්ස් - 94-11-2437583 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | - සභාපති / අධ්‍යක්ෂ - කේ. නලින් ආර් ප්‍රනාන්දු මහතා<br>- අතිරේක ලේකම් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය<br>- ඩී. ජීවනාදන් මහතා<br>- අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ගිණුම් මහා භාණ්ඩාගාරය - ඩී විදානගමාච්චි මහතා<br>- අධ්‍යක්ෂ මහජන මූල්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය එන්. එම්. ඩී. නවරත්න මහතා<br>- අධ්‍යක්ෂ පිස්කල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය අජිත් පෙරේරා අබේසේකර මහතා<br>- සමූපකාර සංවර්ධන කොමසාරිස් ඒ. පී. ජී. කිත්සිරි මහතා<br>- වැඩබලන සමූපකාර සංවර්ධන කොමසාරිස් පී. එච්. ආනන්ද මහතා<br>- සමාගමේ අධ්‍යක්ෂ ක්‍රිශාන්ත කපුවත්ත මහතා<br>- ගරු ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් චමිල ජයාන් මුණසිංහ මහතා |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - සීමාසහිත එම්/එස් කෝපරේට් එෆෙයාර්ස් පුද්ගලික සමාගම, 68/1, ඩෝසන් වීදිය, කොළඹ 02. |
| විගණකවරු | - එම්/එස් පොන්නම්පෙරුම සහ සමාගම, වරලත් ගණකාධිකාරීවරු පළමු මහල, හැව්ලොක් පාර, කොළඹ 06. |
| සමාගමේ බැංකුකරුවෝ | - මහජන බැංකුව සංස්ථාපිත ශාඛාව, ලේක් හවුස් ගොඩනැගිල්ල, ඩී, ආර්, විජේවර්ධන මාවත, කොළඹ 10. |
| කොටස්කරුවෝ | - මහා භාණ්ඩාගාරය - කොටස් සියයට 45 යි, සමුපකාර තොග වෙළඳ සංස්ථාව සියයට 55 යි. |



# දැක්ම

පුළුල් ලෙස පැතිර ගිය සිල්ලර වෙළඳ ජාලයක් බවට පත්වීම හා පාරිභෝගිකයන් වෙනුවෙන් කැපවූ අගයෙන් අනූන විශිෂ්ට සේවා සපයන්නෙකු බවට පත්වීම අපේ දැක්මයි.



# මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් භාණ්ඩ මිලදී ගනිමින්, රටපුරා ඇති අපගේ අලෙවිසැල් ජාලය මගින් සාධාරණ මිලට පාරිභෝගික භාණ්ඩ ලබා දෙමින්, කාර්යක්‍ෂම හා උසස් තත්ත්වයෙන් පාරිභෝගික සේවාවක් සැලසීම අපේ මෙහෙවරයි.

# අපේ අභිමතාර්ථ

තත්ත්වයෙන් උසස් භාණ්ඩ සාධාරණ මිලකට ලබාදීම.
ලංකා සතොස සන්නාම ප්‍රතිරූපය නංවාලීම.
ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ඇතිකිරීම.
දේශීය ගොවියන්ගේ හා කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම තුළින් ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම.
රටේ මිල මට්ටම් ස්ථාවරව පවත්වාගෙන යාම.

## සභාපතිතුමාගේ පණිවුඩය



සීමාසහිත ලංකා සතොස 2011 දෙසැම්බර් 31 න් අවසන් වන වසරේ වාර්ෂික වාර්තාව හා විගණන මූල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටින් ඉදිරිපත් කරමි.

### කාර්ය සාධන සංක්ෂිප්ත වාර්තාව

2011 දෙසැම්බර් 31 න් අවසන් වන වසරේ සමාගමේ ආදායම සියයට 27 ක වර්ධනයක් සහිතව රුපියල් බිලියන 16.5 ක් වාර්තා කළේය. 2011 වසරේ දළ ලාභය රුපියල් මිලියන 1,837.4 කි. එය 2010 වසරේ ලාභය වූ රුපියල් මිලියන 1,135.7 ට සාපේක්ෂව සියයට 62.7 ක වර්ධනයකි. එම කාලය තුළ මෙහෙයුම් ලාභය ඉකුත් වසරට සාපේක්ෂව 3.5 ගුණයකින් වැඩිවී රුපියල් මිලියන 251.4 දක්වා ළඟා විය. 2011 දී සමාගම වෙත පැවති සියලු බදු වලින් නිදහස් කරනු ලැබීය. එය  රජය ගනු ලැබූ හොඳ ක්‍රියාමාර්ගයකි. මන්ද ? රටේ සුළු හා මධ්‍ය ආදායම් සහිත පාරිභෝගික කණ්ඩායම්වලට අත්‍යාවශ්‍ය භාණ්ඩ ඉතා සුළු ලාභයක් මත සහන මිලට අලෙවි කරමින් සේවා සැලසීම ලංකා සතොස ප්‍රධාන අරමුණ බැවිනි.  එහිදී විශේෂයෙන් අගය එකතුකළ විවිධ සේවා සපයමින් පාරිභෝගික ප්‍රජාව ආකර්ෂණය කරගත් තරඟකාරී ප්‍රබල ආයතන සමග දැඩි තරඟයක යෙදීමට අප ආයතනයට සිදුවිය. එබැවින් රජය ගත් එම ක්‍රියාමාර්ගය අප සමාගමට විශාල ධෛර්යක් විය.

මෙම වසරේදී ලංකා සතොස සිය අලෙවිසැල් ජාලය ශාඛා 31 කින් වැඩිකරගෙන ඇති අතර, වසර අවසානයේදී එම සංඛ්‍යාව 250 ක් විය. එමෙන්ම මෙම වසරේදී රටේ තරුණ තරුණියන් උදෙසා රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් උත්පාදනය කිරීමටද සතොසට හැකියාව ලැබුණි. තවදුරටත් ලංකා සතොසේ ක්‍රියාකාරිත්වය දිවයින පුරා ව්‍යාප්ත වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වැඩි වැඩියෙන් පාරිභෝගිකයෝ සාධාරණ මිලට තත්ත්වයෙන් උසස් භාණ්ඩ ලබාගැනීම සඳහා සතොස වෙත යොමු වූහ. මේ නිසා පුද්ගලික ව්‍යාපාරිකයන්ට වැඩි මිලට භාණ්ඩ අලෙවි කරමින් පාරිභෝගිකයන්ගේ අධික ලෙස ලාභ ලැබීමේ ඉඩ ප්‍රස්ථා සීමා කෙරෙන ලදී. අනෙක් අතට ඔවුන්ට වෙළඳපොළේ භාණ්ඩ හිඟයක් මවාපාමින් සිතුමතේ මිල ඉහළ දැමීමටද නොහැකි වී ඇත. එබැවින් අසාධාරණ වෙළඳ ක්‍රියාවලින් හා පාරිභෝගිකයා පීඩාවට පත්වීම වළක්වා ගැනීම සඳහා රජයට සහාය වීමට ලංකා සතොසට හැකියාව ලැබී ඇති අතර, සහන මිලට අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හිඟයකින් තොරව සැපයීමට හැකිවී ඇති බව මම ආඩම්බරයෙන් යුතුව ප්‍රකාශ කරමි.

### ස්තුතිය

අවසන් වශයෙන් අභියෝගාත්මක වසරක සතොස කාර්යමණ්ඩලය දැක්වූ අධිෂ්ඨානය හා ඉටුකළ සේවාව පිළිබඳව ඔවුන්ට කෘතඥතාවය දැක්වීමටද මම මෙය අවස්ථාව කරගනිමි. ආයතනය ඉහළ තලයකට නංවාලීමට සිය ඉදිරිය දැකීමේ හැකියාව හා නායකත්වය මෙහෙය වූ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ හද පත්ලෙන් නැගෙන ස්තුතිය පුදකරමි. එමෙන්ම ආයතනයේ උන්නතිය වෙනුවෙන් දිගටම සහාය දක්වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රයේ සැපයුම්කරුවන්ට හා මූල්‍ය ආයතනවලටද මගේ ස්තුතිය හිමි වේ. එසේම අපේ කළමනාකරණ කණ්ඩායම්, සියලු මට්ටමේ කාර්ය මණ්ඩලය හා අප ගැන විශ්වාසය තබා කටයුතු කරන පාරිභෝගික ප්‍රජාවටද මගේ කෘතඥතාව මෙයින් පුදකරමි.

නලීන් ප්‍රනාන්දු

සභාපති

## අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අධ්‍යක්ෂවරු 2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමග ඔවුන්ගේ වාර්තාව මෙයින් ඉදිරිපත් කෙරේ.

**තැන්පතු**
සමාගමේ මුළු තැන්පතු වටිනාකම රුපියල් මිලියන 275.4 කි (2010 රු මිලියන 23.9)

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**
2011 දෙසැම්බර් 31 වනවිට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 70 කි.

**රජයේ අරමුදල**
සමාගමේ රජයේ අරමුදල රුපියල් මිලියන 757.1 කි. (2010 රු. මිලියන 699.4)

**ප්‍රාග්ධන වියදම**
සමාගමේ දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 197.5 ක් වේ. (2010 රු. මිලියන 183.9) වැඩි විස්තර මූල්‍ය ප්‍රකාශනවල අංක 12 සටහනේ සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
සංස්ථාපිත තොරතුරු පිටුවේ දක්වා ඇති අධ්‍යක්ෂවරු විමර්ශනයට ලක් වූ වසර පුරාම සමාගමේ අධ්‍යක්ෂවරු වෙති.

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ අයිතිවාසිකම්**
මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 23 හි සඳහන් පරිදි සමාගමේ වත්මන් ව්‍යාපාර සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂවරුන්ට කිසිදු ඍජු හෝ වක්‍ර අයිතිවාසිකමක් නැත.

**විගණනකරුවෝ**
පොන්නම්පෙරුම සහ සමාගමේ වරලත් ගණකාධිකාරීවරු වසර 2011 සිට සමාගමේ විගණනකරුවන් ලෙස පත්කරනු ලැබ ඇති අතර, ඔවුන් යළිත් පත් කරනු ලැබීමට කල්පනා කොට ඇත. විගණනකරුවන්ගේ වැටුප් පිළිබඳව තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂවරුන් වෙත පවරා ඇත.

**වාර්තාකරණ කාලසීමාවට පසුව ඇති වූ සිදුවීම්**
සමාගමේ වාර්තාකරණ කාලසීමාවට පසුව ඇති වූ සිදුවීම් මුදල් ප්‍රකාශනවල සටහන් අංක 22 හි සඳහන් කොට ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතට අනුව 2011 වසරේ සිට සීමාසහිත ලංකා සතොස සමාගම රජය විසින් සියලුම වර්ගයේ බදු වලින් නිදහස් කොට ඇත. වාර්තාකරණ කාලසීමාව සඳහා ශ්‍රී ලංකා රජය වෙත සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා හෝ ලබාදී ඇත.

**ප්‍රවර්තන ව්‍යාපාර**
මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවර්තන ව්‍යාපාර පදනම භාවිත කළේය. කළමනාකාරීත්වයෙන් විමසීම් කරන ලදුව එම කණ්ඩායම සතු වූ දුරදක්නා අනාගතයක් උදෙසා සිය මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඔවුන් සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

අත්සන් කළේ

සීමාසහිත එම් එස් කෝපරේටිව් එෆෙයාර්ස් (පුද්) සමාගම
සමාගම් ලේකම්
2014 ජුනි 06



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

## සංස්ථාපිත පාලනය


සමාගම තුළ සංස්ථාපිත පාලන කටයුතු විනිවිද භාවයෙන් හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා කාර්ය මණ්ඩලය කැප වී සිටින බැවින් සමාගම ස්ථාවරව පවතී. උසස් ප්‍රමිතියේ සංස්ථාපිත පාලනයක් පවත්වාගෙන යාමට හැකි විශ්වසනීයත්වයක් සමාගම සතුව තිබේ. ඒකාබද්ධ පාලනයක් රඳා පවතින්නේ තිරසාර අගයන් නිර්මාපක හැකියාව ඇති වගකීම් සහිත හා කාර්යසාධනයට කැපවුණු කළමනාකාරීත්වයක් හා පාලනයක් තුළින් බලවත් සංස්ථාපිත වටිනාකම් සමුදායක් අනුගමනය කිරීම තුළින් සමාගම එහි සංස්ථාපිත පාලනය ආයතනගත කර ඇත්තේය. සමාගමේ ප්‍රතිරූපය ඉහළ නැංවෙන පරිදි ඉහළ කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ රාජකාරී කටයුතුවලදී මෙන්ම සෙසු අවස්ථා වලදීද එම වටිනාකම් හොඳින් අනුගමනය කිරීමට කැප වී සිටී. එසේම සමාගම එහි සෑම කටයුත්තකදීම ඒකාබද්ධතාවේ ඉහළම ප්‍රමිතීන්, ආචාර්යධර්ම හා වෘත්තීයභාවය අනුව ක්‍රියා කිරීමට කැප වී සිටී.


සමාගමේ ව්‍යාපාර කටයුතු එහි කළමනාකරුවන්, නිලධාරීන් හා සේවකයින් විසින් / සභාපති / කළමනාකාර අධ්‍යක්ෂ ගේ මගපෙන්වීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ දුරදක්නා නුවන මත සිදුකරගෙන යන්නේ සමාගමේ පාර්ශවකරුවන් වෙනුවෙන් එහි දිගුකාලීන අගය ඉහළ නැංවෙන ආකාරයෙනි. අධ්‍යක්ෂ මණ්ඩලය පාර්ශවකරුවන් වෙනුවෙන් ඉහළ වටිනාකමක් ලැබෙන පරිදි සිය වගකීම් ඉටුකිරීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ සංස්ථාපිත ව්‍යාපාර කටයුතු අවබෝධ කරගැනීමට හොඳින් කැපවී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වී ඔවුන්ගේ පූර්ණ අවධානය පහත දැක්වෙන කරුණු කෙරෙහි යොමුකරති.

- උපාය මාර්ගික හා මෙහෙයුම් කරුණු සමාලෝචනය
- ලාභය, ශ්‍රම ප්‍රාග්ධනය හා මාසික කළමනාකරණ ගිණුම් සමාලෝචනය
- සභාපති / කළමනාකාර අධක්‍ෂ මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට උපදෙස් හා මාර්ගෝපදේශ සැපයීම
- පාර්ශවකරුවන්ට කාලීන හා වාරික වාර්තා සැපයීම හා සංසරණය
- ප්‍රධාන ආයෝජන සඳහා අනුමැතිය පළ කිරීම
- අන්තර්වාර හා වාර්ෂික වාර්තා අනුමත කිරීම

සමාගම හා පාර්ශවකරුවන් අතර ක්‍රියාකාරී සහයෝගීතාවය දිරිගන්වන පරිදි සියලුම පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැප වී සිටී.

මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා











ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා








| අගය එකතු කළ ප්‍රකාශනය | 2011 | 2010 |
|---|---|---|
| අගය එකතු කළ | | |
| මුළු ආදායම | 16,564,050,478 | 13,181,556,160 |
| විකුණුම් පිරිවැය | (14,726,577,161) | (11,898,702,912) |
| මෙහෙයුම්වලින් අගය එකතු කිරීම | 1,837,473,317 | 1,282,853,248 |
| වෙනත් ආදායම් | 76,066,928 | 63,143,462 |
| එකතු කළ මුළු අගය | 1,913,540,245 | 1,345,996,710 |

**එකතු කළ අගය බෙදීයාම**

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| වැටුප් සහ වේතන | 725,652,646 | 38% | 447,605,754 | 33% |
| ක්ෂය වීම් | 86,061,698 | 4% | 50,824,064 | 4% |
| රඳවාගත් ලාභය | 251,490,199 | 13% | 37,867,417 | 3% |
| බදු | | | 181,438,719 | 13% |
| වියදම් ණය හිමියෝ | 850,335,702 | 44% | 628,260,756 | 47% |
| | 1,913,540,245 | | 1,345,996,710 | |



PONNAMPERUMA & CO.
Chartered Accountants

SantaFe
ASSOCIATES INTERNATIONAL

සීමාසහිත ලංකා සතොස සාමාජිකයන් වෙත නිකුත් කරන විගණන වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව

අප සමාගම සීමාසහිත ලංකා සතොස වෙනුවෙන් පහත දැක්වෙන මුදල් ප්‍රකාශ විගණනයට ලක් කර ඇත. එනම් 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරේ ශේෂ පත්‍රය හා ආදායම් ප්‍රකාශනය අදාළ වසරේ කොටස් හා මුදල් ප්‍රවාහය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සංක්ෂිප්ත වාර්තාවක් හා වෙනත් විග්‍රහාත්මක සටහන් ද ඊට ඇතුළත් වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරීත්වයේ වගකීම**
ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කළමනාකාරීත්වය වගකීමෙන් බැඳී සිටී. ඒ අනුව මෙම මුදල් ප්‍රකාශන සැලසුම් කිරීම, වංචා හෝ වැරදි හේතුකොට මූර්ත අවප්‍රකාශවලින් තොරව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම එම වගකීමට අයත් වේ. එමෙන්ම එම මූල්‍ය ප්‍රකාශන සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගනිමින් ඒවා භාවිතයට ගෙන අවස්ථානුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමද එම වගකීමට අයත් වේ.

**ගිණුම්කරණ විෂය පථය හා නිගමන පදනම**
අපේ වගකීම නම් මෙම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අපේ විගණනය අනුව නිගමනයන් ප්‍රකාශ කිරීමයි. අපේ විගණන කටයුතු සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවයි. එම ප්‍රමිතීන්ට අනුව අප සැලසුම් කොට විගණන කටයුතු සිදුකරන්නේ එකී මූල්‍ය ප්‍රකාශන මූර්ත අවප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහාය. විගණනයකදී අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පරීක්ෂණ පදනම මත විමර්ශනය කිරීම, සංඛ්‍යාලේඛන සනාථ කරන සාක්ෂි හා අනාවරණ කිරීම් ආදිය ඇතුළත් වේ. විගණනයකදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා කළමනාකාරීත්වය ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව තක්සේරු කිරීම හා සමස්ත මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳව ද සලකා බැලේ. අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව මෙම විගණන කාර්යය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු දැක්වීම් අපි ලබාගෙන ඇත. එබැවින් අපේ විගණනය අපේ නිගමනය සඳහා සාධාරණ පදනමක් සලසා දෙන බව අපි විශ්වාස කරමු.

**පිළිගත් නිගමනයේ පදනම**

**විෂය පථය හා භාණ්ඩ ලැයිස්තුවල සීමාව**
2011 දෙසැම්බර් 31 දිනට රුපියල් 2,025,186,297 ක් ලෙස සඳහන් වූ ද්‍රව්‍යමය භාණ්ඩ ලැයිස්තු ගණනය කිරීම අපි සොයා නොබැලූවෙමු. මක් නිසාද අප මෙම සමාගම වෙනුවෙන් මූලික වශයෙන් විගණන කටයුතුවල නිරත වන අවස්ථාවේදී එම දින වකවානු පසුවී තිබෙන බැවින්, අනෙක් විගණන ක්‍රමවේද අනුව භාණ්ඩ ලැයිස්තුවල ප්‍රමාණ හෝ තත්ත්වය පිළිබඳව අපට සෑහීමකට පත්වීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් 2011 දෙසැම්බර් 31 වන විට සමාගම භාණ්ඩ ලැයිස්තු පිළිබඳව භෞතික සංගණනයක් සිදුකර ඇති අතර, කළමනාකාරිත්වය එම ශේෂයන් නිවැරදි බවට තහවුරු කර තිබේ. ඒ අනුව භාණ්ඩ ලැයිස්තු, අලෙවි වියදම, ආදායම් බදු, ශුද්ධ ලාභය / (පාඩුව) හා පවතින ඉපයීම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන සංඛ්‍යාලේඛන සඳහා කිසියම් ගැළපීමක් හෝ සංශෝධනයක් සිදුකළ යුතුද යන්න අපට තීරණය කිරීමට නොහැකි වී ඇත.

**දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ**
මෙම සමාගම දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නැත. එබැවින් 2011 දෙසැම්බර් 31 දිනට රුපියල් 362,484,580 (2010 රුපියල් 254,158,678) වටිනාකමකින් යුත් දේපළ, යන්ත්‍රාගාර හා උපකරණවල පරිපූර්ණතාව, පැවැත්ම හා නිරවද්‍යතාවය මෙන්ම මූල්‍ය ප්‍රකාශන අංක 12 සටහනෙහි දක්වා ඇති අදාළ වසර සඳහා රුපියල් 86,061,698 (2010 රුපියල් 50,824,064) වන ක්ෂය වීම් වැය පිළිබඳව අපට සෑහීමකට පත්විය නොහැක.

## නිගමනය

පූර්ව ඡේදයේ දැක්වෙන මූල්‍ය ප්‍රකාශවල සඳහන් කරුණුවලින් මතුවන ප්‍රතිඵල හැරුණු කොට අපගේ විමර්ශනය අනුව අපේ නිගමනය නම් මෙම සමාගම 2011 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව හා 2011 දෙසැම්බර් 31 දිනට එම මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය තත්ත්වය, එහි මෙහෙයුම්වල ප්‍රතිඵල හා සමාගමේ මුදල් ප්‍රවාහ පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ඉදිරිපත් කර ඇති බවයි.

සෙසු නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 151 (2) කොටසේ අවශ්‍යතාවලට අනුකූල බවද සඳහන් කරමු.

පොන්නම්පෙරුම සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ.

2014 ජූනි 06

## සීමාසහිත ලංකා සතොස

### ආදායම් ප්‍රකාශනය

| 2011 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා | සටහන් | 2011 රු | 2010 රු |
|---|---|---|---|
| ආදායම | 03 | 16,564,050,478 | 13,034,080,623 |
| විකුණුම් පිරිවැය | 04 | (14,726,577,161) | (11,898,702,912) |
| දළ ලාභය | | **1,837,473,317** | **1,135,377,710** |
| වෙනත් ආදායම් | 05 | 76,066,928 | 63,143,462 |
| පරිපාලන වියදම | 06 | (599,961,758) | (342,228,716) |
| බෙදාහැරීමේ වියදම් | 07 | (968,373,581) | (756,068,725) |
| වෙනත් මෙහෙයුම් වැය | 08 | (68,525,850) | (1,607,916) |
| මූල්‍ය වියදම් | 09 | (25,188,856) | (26,785,219) |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය / (පාඩුව) | | **251,490,199** | **71,830,597** |
| බදුකරණය | 10 | - | (33,963,181) |
| වසර සඳහා ලාභය / (පාඩුව) | | **251,490,199** | **37,867,416** |
| කොටසක් සඳහා ඉපයීම | 11 | **35,927,171** | **5,409,631** |

15 සිට 23 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අවියෝජනීය කොටසකි.

සීමාසහිත ලංකා සතොස

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2011 රු | 2010 රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ | 12 | 362,484,580 | 254,158,678 |
| | | 362,484,580 | 254,158,678 |
| **ජංගම වත්කම්** | | | |
| **භාණ්ඩ ලැයිස්තුව** | 13 | 2,025,186,297 | 1,583,508,670 |
| ස්ථාවර තැන්පතු | | 40,035,059 | 39,575,854 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 14 | 110,308,764 | 159,857,824 |
| ලැබිය යුතු ආදයම් බදු | | 18,593,218 | 18,593,218 |
| ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු | | 14,464,142 | 14,464,142 |
| ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු මුදල් - සතොස | 15 | 10,083,353 | 6,928,856 |
| අතේ ඇති සහ බැංකුවේ ඇති මුදල් | 16 | 160,136,512 | 130,093,166 |
| | | 2,378,807,346 | 1,953,021,731 |
| **මුළු වත්කම්** | | **2,741,291,926** | **2,207,180,410** |
| **කොටස් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා තැන්පතු** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 17 | 70 | 70 |
| රාජ්‍ය අරමුදල් | | 757,136,000 | 699,400,000 |
| ලාභාලාභ ගිණුම | | 275,406,215 | 23,916,016 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | | 1,032,542,285 | 723,316,086 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ආශ්‍රිත සමාගම්වලට ගෙවිය යුතු මුදල් - සතොස | | 22,798,842 | 22,798,842 |
| විශ්‍රාම සහන බැඳීම් | 18 | 31,053,238 | 17,628,826 |
| | | 53,852,080 | 40,427,668 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 19 | 1,404,424,839 | 1,025,203,747 |
| කෙටිකාලීන ණය | | 30,000,000 | 10,300,000 |
| බැංකු අයිරා | 20 | 220,472,722 | 407,932,908 |
| | | 1,654,897,561 | 1,443,436,656 |
| මුළු කොටස් හා වගකීම් | | **2,741,291,926** | **2,207,180,410** |

15 සිට 23 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අවියෝජනීය කොටසකි.

ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ අවශ්‍යතාවලට අනුකූලවය.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

කොළඹ
2014 ජූනි 06

## සීමාසහිත ලංකා සතොස
## කොටස්වල වෙනස්කම් ප්‍රකාශනය

2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රජයේ අරමුදල් ගිණුම | රඳවාගත් ඉපැයීම් | මුළු කොටස් හිමිකම |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 2010 ජනවාරි 01 ට ශේෂය | 70 | 478,600,000 | (13,951,400) | 464,648,670 |
| වසර සඳහා මුළු ලාභය | - | - | 37,867,417 | 37,867,417 |
| ලැබූ අරමුදල් | - | 220,800,000 | - | 220,800,000 |
| 2010 දෙසැම්බර් 31 ට ශේෂය | 70 | 699,400,000 | 23,916,016 | 723,316,086 |
| 2011 ජනවාරි 01 ට ශේෂය | 70 | 699,400,000 | 23,916,016 | 723,316,086 |
| වසර සඳහා මුළු ලාභය | - | - | 251,490,199 | 251,490,199 |
| ලැබූ අරමුදල් | - | 57,736,000 | - | 57,736,000 |
| 2011 දෙසැම්බර් 31 ට අවසාන ශේෂය | **70** | **757,136,000** | **275,406,215** | **1,032,542,285** |

15 සිට 23 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ

අවියෝජනීය කොටසකි.

## සීමාසහිත ලංකා සතොස
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2011 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා

| | | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් එන මුදල් ප්‍රවාහ** | | | |
| බදුකරණයට පෙර ලාභය / (පාඩුව) | | 251,490,199 | 71,830,597 |
| ගැළපීම් ඃ | | | |
| ක්ෂයවීම් | | 86,061,698 | 50,824,065 |
| පාරිතෝෂික ගෙවීම | | 13,424,411 | 1,834,710 |
| ශ්‍රම ප්‍රාග්ධන වෙනස්කම්වල පෙර මෙහෙයුම් ලාභය | | **350,976,308** | **124,489,372** |
| භාණ්ඩ ලැයිස්තු වල (වැඩිවීම) / අඩුවීම | | (441,677,627) | (800,271,105) |
| වෙළඳ සහ වෙනත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම් | | 49,549,060 | (67,663,589) |
| සමාගම් ශේෂයන් ආශ්‍රිත (වැඩිවීම) / අඩුවීම් | | - | (162,846) |
| වෙළඳ සහ වෙනත් ගෙවීම්වල (වැඩිවීම) / අඩුවීම් | | 379,221,091 | 351,850,651 |
| මෙහෙයුම්වලින් ඉපැයූ මුදල් (වැඩිවීම) / අඩුවීම් | | **338,068,833** | **(391,757,517)** |
| ESC ආර්ථික සේවා ගාස්තු ගෙවීම් | | - | (20,700,862) |
| WHT ගෙවීම් | | - | (472,346) |
| SRL ගෙවීම් | | - | (99,462) |
| මෙහෙයුම් කටයුතුවලින් මුළු මුදල් ප්‍රවාහ / (යන ප්‍රවාහ) | | **338,068,833** | **(413,030,187)** |
| **ආයෝජන කටයුතුවලින් එන මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ මිළදී ගැනීම | | (197,542,097) | (183,955,710) |
| ස්ථාවර තැන්පතු ආයෝජන | | (459,205) | - |
| ආයෝජන කටයුතුවලින් එන මුළු මුදල් ප්‍රවාහ / (යන ප්‍රවාහ) | | **(198,001,301)** | **(183,955,710)** |
| **මූල්‍ය කටයුතුවලින් එන මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | | 57,736,000 | 220,800,000 |
| ලැබුණු / (ආපසු ගෙවූ) කෙටිකාලීන ණය | | 19,700,000 | 977,500 |
| මූල්‍යමය කටයුතුවලින් එන මුළු මුදල් ප්‍රවාහ | | **77,436,000** | **221,777,500** |
| **මුදල් හා ඒ හා සමාන මුළු වැඩිවීම (අඩුවීම)** | | 217,503,531 | (375,208,397) |
| **වසර ආරම්භයේ මුදල් හා ඒ හා සමාන ලැබීම්** | A සටහන | (277,839,742) | 97,368,655 |
| **වසර අවසානයේ මුදල් හා ඒ හා සමාන ලැබීම්** | B සටහන | **(60,336,210)** | **(277,839,742)** |
| **සටහන්** | | | |
| මුදල් හා සමාන දෑ | | **B සටහන** | **A සටහන** |
| බැංකුවේ ඇති මුදල් | | 5,046,851 | 18,886,124 |
| අතේ ඇති මුදල් | | 155,089,661 | 111,207,043 |
| බැංකු අයිරා | | (220,472,722) | (407,932,908) |
| | | **(60,336,210)** | **(277,839,742)** |

15 සිට 23 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අවියෝජනීය කොටසකි.



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

## සීමාසහිත ලංකා සතොස
## මූල්‍ය ප්‍රකාශන සටහන්

**2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**1. සංස්ථාපිත තොරතුරු**

1.1 සීමාසහිත ලංකා සතොස සීමිත බැරකම් සහිත ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි
එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, යෝක් වීදිය, අංක. 108 දරන ස්ථානයේ පිහිටා තිබේ. සමාගමේ ප්‍රධාන කාර්යය නම් පාරිභෝගික නිෂ්පාදන සිල්ලර හා තොග වෙළඳාමයි.

1.2 - 7 සිට 15 දක්වා පිටුවල ඇති මුදල් ප්‍රකාශනයේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අවියෝජනීය කොටසකි

1.3 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මූල්‍ය අගයන් විශේෂයෙන් දක්වා තිබෙන අවස්ථාවලදී හැර ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

**2. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය**

**2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**සකස් කිරීමේ හා පිළිගැනීමේ පදනම**
2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කොට ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිගත් වැය සම්මුතිය යටතේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමන කරුණු සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් සිදුකොට නැත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා 2014 ජුනි 6 දින බලය ලබාදී ඇත.

**2.2 සංසන්දනාත්මක තොරතුරු**
සමාගම විසින් නිරතුරුවම මෙම ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර, පසුගිය කාලය පුරා එය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. වත්මන් කාලයේ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල ඉකුත් සමයේ සංඛ්‍යා හා වාක්‍යාංශ යළි සකස්කොට යොදා ඇත.

**2.3 බදුකරණය**
**(අ) වර්තමාන බදු**
2007 අංක 7 දරන සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කොට ඇති සීමාසහිත ලංකා සතොස සමාගමේ ලාභය හා ආදායම 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 7 (එච්) කොටස යටතේ (2011 දක්වා සංශෝධන තහවුරු කළ) ආදායම් බද්දෙන් නිදහස් කොට ඇත.

**(ආ) විලම්භිත බදු**
2006 අංක 10 දරන ආදායම් බදු පනතේ (2011 දක්වා සංශෝධන තහවුරු කළ) 7 (එච්) කොටස යටතේ සමාගමේ ලාභය හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති නිසා ප්‍රමාද බද්ද සපයා නැත.

**2.4 දේපළ, පිරියත හා උපකරණ**
දේපළ යන්ත්‍රාගාර හා උපකරණ සඳහන් කර ඇත්තේ වැය රහිත සමුච්චිත ක්ෂයවීම් හා අගය අඩුවීම් සැලකිල්ලට ගනිමිනි. ක්ෂයවීම් ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ ඇස්තමේන්තු ගත භාවිතා කළ හැකි කාලසීමාව හා පහත දැක්වෙන වාර්ෂික ක්ෂයවීම් ප්‍රතිශතයන් සැලකිල්ලට ගෙන සරල රේඛීය ක්ෂයවීම් පදනම යටතේය.

| | |
|---|---|
| ගොඩනැගිලි | 10% |
| මෝටර් වාහන | 20% |
| කාර්යාල උපකරණ | 20% |
| සන්නිවේදන උපකරණ | 20% |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 20% |
| පරිගණක | 25% |
| සතොස වත්කම් | 17.5% |

සින්නක්කර ඉඩම් සඳහා ක්ෂයවීම් ගණනය කර නැත. දේපළ ක්ෂයවීම් ආරම්භ වන්නේ එම දේපොළ ප්‍රයෝජනයට ගත් දින සිටය.

සෑම මුදල් වර්ෂයකදීම දේපළවල ඉතිරි අගයන් ප්‍රයෝජනයට ගතහැකි කාලසීමාව හා ක්ෂයවීම් ක්‍රමවේද සුදුසු පරිදි සමාලෝචනය කොට ගළපාගන්නා ලදී.

## සීමාසහිත ලංකා සතොස
## සටහන් (ඉතිරි කොටස)

**2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**2.5 ප්‍රවර්තන ව්‍යාපාර**
සමාගමේ අධ්‍යක්ෂවරු සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක නිරතව සිටින අතර, සමාගමේ වෙළඳාම් නතර කිරීමට හෝ සමාගම ඈවර කිරීමට හෝ අපේක්‍ෂා නොකරති.

**2.6 භාණ්ඩ ලැයිස්තුව**
සෙමෙන් අලෙවි වන අභාවිත භාණ්ඩ කෙරෙහි ඉඩහරිමින් අවම වැය හා සාක්‍ෂාත් කරගත හැකි ශුද්ධ අගය මත භාණ්ඩ ලේඛන සඳහන් කර ඇත. සාමාන්‍ය වෙළඳාමේදී ලැයිස්තුගත භාණ්ඩ අලෙවි කෙරෙන්නේ පූර්ණ තක්සේරු වැය හා අලෙවිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඇස්තමේන්තු වැයට අඩුවෙන් ඒ ඒ අවස්ථාවේ සාක්‍ෂාත් කර ගත හැකි ශුද්ධ අගය මතය.

**2.7 වෙළඳ හා වෙනත් ලැබීම්**
වෙළඳ හා වෙනත් ලැබීම් ප්‍රකාශිතව ඇත්තේ අයෝග්‍ය හා සැකසහිත ලැබීම් සඳහා සාක්‍ෂාත් කර ගත හැකි ප්‍රතිපාදන තක්සේරු කරගැනීමෙන් පසුවය. අදාළ පාර්ශවකරුවන්ගෙන් ලැබිය යුතු වෙනත් ලැබීම් හඳුන්වනු ලබන්නේ අයෝග්‍ය හා සැකසහිත ලැබීම් සඳහා වැය ප්‍රතිපාදන අඩුකිරීමට යටත්වය.

**2.8 මුදල් හා මුදල් සමාන දේ**
මුදල් හා මුදල් සමාන දේ ලෙස අර්ථ දැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන ඇඩි ද්‍රවශීල ආයෝජන, පහසුවෙන් මාරුකළ හැකි බවට හඳුනාගත් මුදල් හා අගය වෙනස්වීමේ අවදානමට ඉතා සුළුවෙන් ලක් වූ මුදල්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය උදෙසා මුදල් හා මුදල් සමාන දේ ලෙස අතේ ඇති මුදල් හා බැංකු තැන්පතු, හිඟව තිබෙන බැංකු අයිරා, කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන ද (උදා. තුන් මාසයක් හෝ ඊට අඩු කාලයකින් යළි අත්පත් කරගත හැකි) සලකනු ලැබේ.

**2.9 ආයෝජන**
වත්මන් ආයෝජන වටිනාකම මත ප්‍රකාශිතව ඇත.

**2.10 බැරකම් සහ ප්‍රතිපාදන**
සියලු ද්‍රව්‍යමය බැරකම් ශේෂ පත්‍රයේ සඳහන් දිනට අනුව ගිණුම්වලට බැරකර ඇත.

**2.11 නිශ්චිත දායකත්ව සැලසුම්**
සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF)
අදාළ අණපනත් හා රෙගුලාසිවලට අනුකූලව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල දායකත්වයට සුදුසුකම් ලබා සිටිති. සමාගම සේවකයින්ගේ දළ වැටුප මෙන් සියයට 12 ක් සේවක අර්ථසාධක අරමුදල සඳහා ද සියයට 3 කින් සේවක භාරකාර අරමුදල සඳහාද දායක වෙයි.

**2.12 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**
විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය කරනු ලබන්නේ 1983 අංක 12 දරන ශ්‍රී ල.ප.සේ 16 / පාරිතෝෂික පනතට සමානුරූපීවය. මෙහිදී වයස අනුව තක්සේරු කිරීමක් සිදුනොවේ.

**2.13 ආදායම් පිළිගැනීම**
(අ) භාණ්ඩ අලෙවිය
ආදායම් හඳුනාගනු ලබන්නේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාව්‍යතාව අනුවය.  ආදායම් හා දරන ආශ්‍රිත වියදම් විශ්වාසනීය ලෙස ගණනය කළ හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබිය හැකි මුළු වෙළඳ වට්ටම් හා අලෙවි බදුවල සාධාරණ අගය සැලකිල්ලට ගැනීමෙනි.

**(ආ) පොලිය**
පොලී ආදායම හඳුනාගනු ලබන්නේ එක්රැස්කරගැනීම සැකසහිත නොවන විට එකතු වූ පොලිය මතය.

**(ඇ) වෙනත්**
වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ එකතුවන පදනම මතය.

දේපළ, යන්ත්‍රාගාර උපකරණ හා ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ සිදුවන ශුද්ධ ලාභය සහ පාඩු පිළිබඳව ආදායම් ප්‍රකාශනයේ හේතු දක්වා ඇත. එම බැහැරකිරීම් ක්‍රියාවලියේදී අදාළ දේපළ යන්ත්‍රාගාර හා උපකරණ ආදී වත්කම්වල ධාරණ අගය යළි තක්සේරු කිරීමට ලක්කොට ඍජුවම එම වත්කම් සමුච්චිත පාඩුවක් ලෙස සලකනු ලැබේ.

## සීමාසහිත ලංකා සතොස
## සටහන් (ඉතිරි කොටස)

**2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**2.14 වියදම් හඳුනාගැනීම**
ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද වැය හා විශේෂිත ආදායම් අයිතම, ලද ඉපැයීම් අතර ඍජු සම්බන්ධතා පදනම යටතේය. ව්‍යාපාර පවත්වාගෙන යාමේදී හා දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් වසරේ ලාභය සඳහා හේතු වූ ආදායමක් බවට හරවා තිබේ.

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කටයුත්ත වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දරන මතය නම් එහි වියදම් මෙහෙයුම් ක්‍රමවේදය සමාගමේ කාර්ය සාදන මූලික ප්‍රතිපත්තිවලට සාධාරණ වන බවයි. ඒ අනුකූලව ඉදිරිපත් කිරීම් ක්‍රමවේදය භාවිත කළ බව අධ්‍යක්ෂ මණ්ඩලයේ පිළිගැනීමයි.

**2.15 ශේෂ පත්‍රයෙන් බැහැර දේ හා ආදායම් ප්‍රකාශන අයිතම**

**2.15.1 ශේෂ පත්‍රයෙන් පසුව සිදුවූ අවස්ථා**
ශේෂ පත්‍රය නිමකළ දිනට පසුව සිදු වූ සියලු භෞතික සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර, අවස්ථානුකූලව අවශ්‍ය ගැළපීම් හෝ අනාවරණ කිරීම් මුදල් ප්‍රකාශනයේ අදාළ සටහන්වල ඇතුළත් කොට ඇත.

2.15.2 අවිනිශ්චිත අවස්ථා සහ හඳුනා නොගත් ගිවිසුම්කර බැඳීම්.
අවිනිශ්චිත අවස්ථා යනු අතීත සිදුවීම් අනුව මතුවිය හැකි වත්කම් හෝ බැඳීම් වන අතර, ඒවා සමාගමේ පාලනයට නතු නොවන මෙන්ම සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කරගත හැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් වේ.

## සීමාසහිත ලංකා සතොස
## සටහන්

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **3. ආදායම** | | | |
| දළ පිරිවැටුම | | 16,564,050,478 | 13,181,556,160 |
| පිරිවැටුම් බද්ද | | - | (147,475,537) |
| | | **16,564,050,478** | **13,034,080,623** |
| සටහනඃ ජා.ගො. බද්දෙන් නිදහස් කරන ලදී. | | | |
| **4. අලෙවි වියදම්** | | | |
| ආරම්භක භාණ්ඩ ලැයිස්තුව | | 1,583,508,670 | 783,237,566 |
| මිලදී ගැනීම් | | 15,168,254,788 | 12,698,974,017 |
| | | 16,751,763,458 | 13,482,211,583 |
| වසර අවසානයේ භාණ්ඩ ලැයිස්තුව | | (2,025,186,297) | (1,583,508,670) |
| | | **14,726,577,161** | **11,898,702,912** |
| **5. වෙනත් ආදායම්** | | | |
| වෙළඳ ප්‍රචාරණ ප්‍රතිපූරණය | | 735,000 | 363,254 |
| ගොන්ඩෝලා ආදායම | | 26,055,832 | 18,084,247 |
| රක්‍ෂණ වන්දි ලැබීම් | | - | 98,697 |
| ස්ථාවර තැන්පත් පොලී | | 3,211,217 | 3,585,719 |
| ලොතරැයි කොමිස් | | 1,684,943 | - |
| පෙර වසරේ ගැළපීම් | | - | 633,682 |
| අලෙවි ප්‍රවර්ධනය | | 2,940,705 | 3,873,262 |
| මුක්තාවශේෂ ආදායම | | 5,740,097 | 3,495,161 |
| යළි අත්කරගත් තොග හිඟ | | 809,153 | 545,349 |
| විවිධ ආදායම් | | 6,856,104 | 5,892,317 |
| යළි අත්කරගත් දුරකථන ගාස්තු | | - | 4,965 |
| ප්‍රවාහන ආදායම | | 27,331,542 | 20,943,764 |
| අලෙවි නොවූ භාණ්ඩ සඳහා ආපසු ලැබීම් | | 702,333 | 5,623,044 |
| | | **76,066,928** | **63,143,462** |
| **6. පරිපාලන වියදම්** | | | |
| වාර්ෂික නිවාඩු සඳහා ගෙවීම් | | 7,771,892 | 6,005,578 |
| විගණන ගාස්තු හා වියදම් | | 972,000 | 1,125,015 |
| තොග සංගණන ගාස්තු | | 355,300 | - |
| බදු ගාස්තු හා වියදම් | | - | 87,000 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුව | | 11,798,473 | 17,971,400 |
| මෝටර් කාර් කුලී | | 835,000 | 906,000 |
| අනියම් වේතන | | 40,166,282 | 27,383,284 |
| ගීතාගාර ගාස්තු | | 15,905,240 | - |
| පිරිසිදු කිරීමේ ගාස්තු | | 767,699 | 652,580.0 |
| ජීවන වියදම් සහ වෙනත් දීමනා | | 164,040,140 | 48,665,664 |
| ක්‍ෂයවීම් | | 81,501,929 | 46,264,297 |
| සතොස දේපළ සඳහා ක්‍ෂයවීම් | | 4,559,769 | 4,559,769 |
| අධ්‍යක්‍ෂ ගාස්තු | | 45,000 | - |
| පරිත්‍යාග | | 459,520 | 287,321 |
| විදුලිබලය | | 68,410,413 | 39,545,463 |
| විදුලි අලුත්වැඩියා | | 2,689,228 | 2,035,230 |
| වැටුප් | | 19,461,081 | 18,316,979 |
| සේවක අර්ථසාධක අරමුදල | | 2,335,330 | 1,654,268 |
| සේවක භාරකාර අරමුදල | | 583,832 | 12,470 |
| දඩ සහ අධිභාර | | 12,126 | 2,931,927 |
| පාරිතෝෂික වියදම් | | 13,424,411 | 1,834,710 |
| කොන්ත්‍රාත් වේතන | | 49,950 | - |
| පණිවිඩකරණ වියදම් | | 226,081 | - |
| ඉන්ධන වියදම් | | 16,761,535 | 9,327,414 |
| පලිබෝධ නාශනය | | 820,432 | - |



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

## සීමාසහිත ලංකා සතොස
## මුදල් ගිණුම් සඳහා සටහන්

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| **6. පරිපාලන වියදම් .... (ඉතිරි ........)** | | |
| සේවා ගිවිසුම් ගාස්තු | 506,823 | - |
| රක්‍ෂණය | 1,802,150 | 2,183,280 |
| නීති ගාස්තු | 56,569 | 70,454 |
| ජාල සම්බන්ධතා ගාස්තු | - | 89,712 |
| බලපත්‍ර ගාස්තු | 141,186 | 1,940 |
| මත්පැන් බලපත්‍ර අලුත්කිරීම | 5,485,000 | 6,203,739 |
| යන්ත්‍ර නඩත්තුව | 5,320,288 | 4,055,224 |
| කළමනාකරණ ගාස්තු | - | 7,000 |
| ජංගම දුරකථන ප්‍රතිපූරණ වියදම් | - | 2,549 |
| ජංගම දුරකථන ගාස්තු | 338,500 | 348,500 |
| කිරුම් මිණුම් ගාස්තු | 940,883 | 371,463 |
| වෛද්‍ය වියදම් | 2,378 | 300 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියාව | 5,850 | 88,353 |
| වෙනත් වියදම් | 7,665,070 | 8,898,588 |
| වෙනත් ආරක්‍ෂණ වියදම් | - | 454,066 |
| අතිකාල | 79,357,186 | 52,895,987 |
| වාර සඟරා | 14,885 | 13,920 |
| වරිපනම් | 2,068,858 | 1,640,918 |
| තැපැල් ගාස්තු | 41,873 | 32,464 |
| ලේඛන ගාස්තු | 37,400 | 10,388 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 852,270 | 111,865 |
| මුද්දර ගාස්තු | 18,000 | - |
| වෘත්තීය ගාස්තු | 4,416,070 | - |
| ලිපිද්‍රව්‍ය | 18,470,471 | 15,921,681 |
| යැපුම් දීමනා | 1,419,005 | 839,164 |
| දුරකථන සහ අන්තර් ජාල | 12,552,334 | 14,301,324 |
| ගමන් වියදම් | 72,157 | - |
| මෝටර් වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 157,760 | 594,255 |
| | 4,266,131 | 3,525,214 |
| | **599,961,758** | **342,228,716** |
| **7. බෙදාහැරීම් වියදම්** | | |
| වෙළඳ ප්‍රචාරණය | 10,193,175 | 8,140,058 |
| ප්‍රසාද දීමනා | 13,454,150 | 6,032,850 |
| බෝතල් සිසිලන යන්ත්‍ර නඩත්තු ගාස්තු | 224,595 | 61,432 |
| පාරිභෝගික ද්‍රව්‍ය ගබඩා ගාස්තු | 6,127,354 | 4,127,806 |
| වැටුප් | 369,760,542 | 273,271,659 |
| සේවක අර්ථසාධක අරමුදල | 44,371,265 | 31,138,331 |
| සේවක භාරකාර අරමුදල | 11,092,816 | 7,777,259 |
| ඇසුරුම් මලු (ග්‍රොසරි බෑග්) | 108,880,014 | 129,520,964 |
| ඇසුරුම් ගාස්තු | 5,477,486 | 3,160,696 |
| මුද්‍රණ වියදම් | 6,825,056 | 9,810,160 |
| කුලී | 133,111,651 | 82,389,283 |
| අලෙවි වට්ටම් | 166,915 | - |
| උත්සව සමයේ සැරසිලි | 99,289 | - |
| ආරක්‍ෂක වියදම් | 71,834,375 | 47,102,644 |
| ලිපිද්‍රව්‍ය | 1,547,044 | 1,106,946 |
| යාපනය ප්‍රවාහන ආරක්‍ෂණ වියදම් | - | 437,200 |
| රාක්ක අලුත්වැඩියාව හා නඩත්තුව | 28,000 | 104,000 |
| ප්‍රවාහන ගාස්තු | 164,742,388 | 146,762,895 |
| ගමන් වියදම් | 3,303,275 | 2,332,537 |
| සුභසාධන වියදම් | 17,134,190 | 2,792,006 |
| | **968,373,581** | **756,068,725** |

## සීමාසහිත ලංකා සතොස
## මුදල් ගිණුම් සඳහා සටහන්

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| **8. වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| මුදල් පාලන ගිණුම් ශේෂ කපා හැරීම | - | 139,874 |
| අවප්‍රශ්නය - සැපයීම කපාහැරීම | 63,581,943 | - |
| පෙර වසරේ ගැලපීම | 4,590,246 | - |
| අලෙවි නොවූ භාණ්ඩ ශේෂ කපාහැරීම | 181,590 | 1,458,240 |
| නොපිය වූ අත්මුදල් කපා හැරීම | 170,797 | - |
| රඳවාගැනීම බදු කපාහැරීම | 1,275 | 9,802 |
| | **68,525,850** | **1,607,916** |
| **9. මුදල් වියදම්** | | |
| හර බදු | 5,885,211 | 10,468,384 |
| ණය පොලී | 3,332,114 | 2,569,110 |
| බැංකු ගාස්තු හා කොමිස් | 15,971,531 | 13,747,724 |
| | **25,188,856** | **26,785,219** |
| **10. ආදායම් බදු වියදම්** | | |
| වත්මන් ආදායම් බදු ප්‍රතිපාදන | - | 16,876,510 |
| ප්‍රමාද බදු ප්‍රතිපාදන | - | 17,086,672 |
| | **-** | **33,963,182** |

2006 අංක 10 දරන ආදායම් බදු (සංශෝධන) පනතේ 7(H) කොටස යටතේ 2011 වසරේ සිට ආදායම් බදුවලින් නිදහස් කොට ඇත

**11. සාමාන්‍ය කොටසක් වෙනුවෙන් මූලික ඉපැයීම**

සාමාන්‍ය කොටසක් සඳහා මූලික ඉපැයීම් / පාඩුව ගණනය කරනු ලබන්නේ වසර සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය වන ශුද්ධ ලාභය (පාඩුව) ශේෂ පත්‍රයේ දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදනු ලැබීමේ පදනම මතය.

| **ලවය ලෙස භාවිත ප්‍රමාණය** | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපිත ලාභය /(පාඩුව) (රු) | 251,490,199 | 37,867,416 |
| හරය ලෙස භාවිත සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | | |
| නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 7 | 7 |
| කොටසක මූලික ඉපැයුම් (රු) | **35,927,171** | **5,409,631** |

| **12. දේපළ යන්ත්‍රාගාර හා උපකරණ** | 2011.01.01 ට ශේෂය රු | ගැළපීම් රු | එක්කිරීම් / ඉවත්කිරීම් රු | 2011.12.31 ට ශේෂය රු |
|---|---|---|---|---|
| වියදම | | | | |
| ඉඩම් | 1,425,000 | (1,425,000) | - | - |
| ගොඩනැගිලි | 16,897,087 | 1,425,000 | 25,638,569 | 43,960,656 |
| මෝටර් වාහන | 5,521,440 | - | 13,300,000 | 18,821,440 |
| පරිගණක උපකරණ | 25,766,264 | - | 18,756,686 | 44,522,950 |
| කාර්යාල උපකරණ | 260,172,174 | - | 53,544,316 | 313,716,490 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 6,839,716 | - | 85,443,076 | 92,282,792 |
| සන්නිවේදන උපකරණ | 2,730,225 | - | 859,450 | 3,589,674 |
| සතොස වත්කම් | 25,953,339 | (3,154,497) | - | 22,798,842 |
| | **345,305,244** | **(3,154,497)** | **197,542,097** | **539,692,844** |

| | 2011.01.01 ට ශේෂය රු | එක්කිරීම් / ඉවත්කිරීම් රු | 2011.12.31 ට ශේෂය රු |
|---|---|---|---|
| ක්ෂයවීම් | | | |
| ගොඩනැගිලි | 1,044,230 | 4,466,257 | 5,510,487 |
| මෝටර් වාහන | 2,737,333 | 3,630,073 | 6,367,406 |
| පරිගණක උපකරණ | 9,460,889 | 5,373,565 | 14,834,454 |
| කාර්යාල උපකරණ | 52,812,220 | 67,695,795 | 120,508,015 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 4,395,252 | 1,055,996 | 5,451,248 |
| සන්නිවේදන උපකරණ | 1,800,313 | 420,185 | 2,220,498 |
| සතොස දේපළ | 18,896,329 | 3,419,826 | 22,316,155 |
| | **91,146,566** | **86,061,698** | **177,208,263** |
| **ශුද්ධ පොත් අගය** | **254,158,678** | | **362,484,580** |



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

## සීමාසහිත ලංකා සතොස
## මුදල් ගිණුම් සඳහා සටහන්

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **13. භාණ්ඩ ලැයිස්තු** | | | |
| ප්‍රතිපාදන අයිතම | | 1,077,372,376 | 866,440,322 |
| සිල්ලර බඩු | | 879,998,004 | 661,221,477 |
| සංක්‍රාන්ති තොග | | - | 18,055,797 |
| මත්පැන් | | 67,815,917 | 37,791,075 |
| | | 2,025,186,297 | 1,583,508,670 |
| **14. වෙළඳ සහ වෙනත් ලැබීම්** | | | |
| මුදල් මැම පාලනය | | 13,749,881 | 9,853,733 |
| කාඩ්පත් පාලනය | | 2,428,825 | 601,476 |
| චෙක්පත් පාලනය | | - | 188,617 |
| ණය සහ අත්තිකාරම් | | 2,347,278 | 158,348 |
| ලංකා සතොස සුභසාධක සංගමය | | - | 562,969 |
| මත්පැන් බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු පෙර ගෙවීම් | | - | (123,000) |
| වෙනත් ලැබීම් - කොටස් සඳහා | | 70 | 70 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | | 238,682 | 341,682 |
| කුලී අත්තිකාරම් | | 66,846,158 | 52,664,102 |
| කුලී තැන්පතු | | 1,671,950 | 2,268,155 |
| කුලී පෙරගෙවුම් | | 437,408 | 2,201,203 |
| ලොතරැයි මුදල් පාලනය | | 239,185 | - |
| බිත්තර සහ පොල් පාලනය | | 55,100 | - |
| නැව් ගාස්තු සුරකුම් | | - | 24,961,930 |
| අවප්‍රේෂනය | 14.1 | 20,799,590 | 63,581,943 |
| රැඳවුම් බද්ද | | 337,013 | - |
| නොපිය වූ අත්මුදල් | | - | 170,797 |
| උත්සව අත්තිකාරම් පාලනය | | 1,157,625 | (333,700) |
| ගොඩනැගිලි ඉදිකිරීම් අත්තිකාරම් | | - | 2,300,000 |
| තෑගි වවුචර නිකුත් කිරීම පාලනය | | - | 459,501 |
| | | 110,308,764 | 159,857,824 |
| **14.1 අව ප්‍රේෂණය** | | | |
| 2011.12.31 ට ශේෂය | | 84,381,533 | |
| අඩුකළා ඃ ප්‍රතිපාදන කපා හැරීම (ආරම්භක ශේෂය) | | (63,581,943) | |
| | | 20,799,590 | |
| **15 ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු දේ - සතොස** | | | |
| සමුපකාර තොග වෙළඳ සංස්ථාව | | 10,083,353 | 6,928,856 |
| | | 10,083,353 | 6,928,856 |
| **16. අතැති සහ බැංකුවේ ඇති මුදල්** | | | |
| මහජන බැංකුව - ඉතිරිකිරීමේ ගිණුම | | 2,548,254 | 6,257,589 |
| මහජන බැංකුව - මාස්ටර් කාඩ් | | 2,498,597.28 | 5,392,278 |
| අත්මුදල් අත්තිකාරම් | | 1,214,912 | 562,347 |
| මුදල් පාලනය | | 151,685,172 | 109,348,941 |
| ඉපිලෙන මුදල් | | 1,500,755 | 1,295,755 |
| විශේෂ අත්මුදල් | | 688,822 | - |
| ණයකර ලිපි මුදල් තැන්පතු | | - | 7,236,256 |
| | | 160,136,512 | 130,093,166 |
| **17. ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 70 | 70 |
| රුපියල් 10 බැගින් වූ 07 සාමාන්‍ය කොටස් | | 70 | 70 |

## සීමාසහිත ලංකා සතොස
## මුදල් ගිණුම් සඳහා සටහන්

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **18. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික** | | | |
| වසර මුලදී ප්‍රතිපාදන | | 17,628,826 | 15,794,116 |
| වසර සඳහා ප්‍රතිපාදන | | 13,424,411 | 1,834,710 |
| | | 31,053,238 | 17,628,826 |
| වසර සඳහා ප්‍රතිපාදන | | - | - |
| වසර අවසානයේ ප්‍රතිපාදන | | **31,053,238** | **17,628,826** |
| **19. වෙළඳ සහ වෙනත් ගෙවීමට ඇති දේ** | | | |
| වෙළඳ ණය හිමියෝ | | 1,301,427,960 | 874,965,736 |
| වෙනත් ණය හිමියෝ | | 31,054,604 | 25,354,477 |
| අබාන්ස් ණය ගෙවීම් | | 636,548 | - |
| මීඩියාවයිස් පුද් සමාගම | | 1,158,729 | 345,783 |
| වියදම් ණය හිමියෝ | (සටහන 19.1) | 57,722,291 | 62,544,205 |
| පිරිවැටුම් බදු ගෙවීම් ද | | 7,665,684 | 40,828,011 |
| ආර්ථික සේවා ගාස්තු ගෙවීම් | | - | 9,838,732 |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | | - | 4,309,328 |
| ආරක්ෂණ තැන්පතු | | 4,388,500 | 3,019,500 |
| පරිගණක මෘදුකාංග සඳහා ගෙවීම් | | - | 1,406,720 |
| වැට් රැඳවුම් | | - | 510,265 |
| සමාජ සේවා බදු | | - | 156,022 |
| තෑගි වවුචර් නිකුතු පාලනය | | 370,524 | - |
| රඳවාගැනීමේ බදු ගෙවීම් | | - | 1,924,969 |
| | | **1,404,424,839** | **1,025,203,747** |
| **19.1 වියදම් ණය හිමියෝ** | | | |
| සාමාන්‍ය වෙළඳ ප්‍රචාරණ ගෙවීම | | 506,206 | 2,303,366 |
| විගණන හා බදු ගාස්තු වියදම් | | 2,545,615 | 1,710,495 |
| පිරිසිදුකිරීමේ ගාස්තු ගෙවීම | | - | 56,480 |
| කොන්ත්‍රාත් වැටුප් ගෙවීම | | - | 42,709 |
| විදුලිබල ගෙවීම් | | 6,182,405 | 3,579,277 |
| සේවක අර්ථ සාධක අරමුදල් දයකත්වය | | 7,240,209 | 6,990,011 |
| සේවක භාරකාර අරමුදල් දයකත්වය | | 987,301 | 724,947 |
| දඩ ගෙවීම් | | - | 2,748 |
| රක්ෂණ ගාස්තු ගෙවීම් | | - | 15,589 |
| ග්‍රොසරි බෑග් සඳහා ගෙවීම් | | 7,455,550 | 17,525,110 |
| ජංගම දුරකථන එකතුකිරීමේ ගෙවීම් | | 83,096 | 78,012 |
| අතිකාල ගෙවීම් | | 6,666,152 | 7,035,916 |
| උපයන විට ගෙවීම් | | 3,363 | 78,234 |
| පෙට්‍රල් දීමනා ගෙවීම | | - | 98,363 |
| මුද්‍රණ ගාස්තු ගෙවීම | | 227,227 | 803,992 |
| වරිපනම් ගෙවීම | | 24,473 | 174,188 |
| කුලී ගෙවීම - සතොස | | - | 6,170,513 |
| වැටුප් පාලනය | | 3,761,851 | - |
| | | - | (496,426) |
| ලේකම් ගාස්තු ප්‍රතිපාදන | | 20,000 | 50,388 |
| ආරක්ෂක ගාස්තු ගෙවීම් | | 8,101,018 | 5,113,148 |
| දුරකථන ගෙවීම් | | 1,327,646 | 1,483,258 |
| ප්‍රවාහන වියදම් ගෙවීම | | 11,816,327 | 8,441,427 |
| ජල ගාස්තු | | 773,851 | 488,649 |
| සුභසාධන ගෙවීම් | | - | 73,813 |
| | | **57,722,291** | **62,544,205** |
| **20. බැංකු අයිරා** | | | |
| මහජන බැංකුව අත්මුදල් | | 109,395,248.46 | 45,183,905 |
| මහජන බැංකුව මත්පැන් | | 16,322,536.19 | 6,774,130 |
| මහජන බැංකුව ජංගම ගිණුම | | 94,754,937.68 | 355,974,873 |
| | | **220,472,722** | **407,932,908** |



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

# සීමාසහිත ලංකා සතොස
සටහන්

**21. පොරොන්දු වූ වත්කම්**

බැරකම් ආරක්ෂණ ලෙස පහත සඳහන් වත්කම් පොරොන්දු වී ඇත

| වත්කමේ ස්වභාවය | බැරකමේ ස්වභාවය | 2011.12.31<br>රු | 2010.12.31<br>රු |
|---|---|---|---|
| ස්ථාවර තැන්පත් | බැංකු අයිරා පහසුකම් | 40,035,059 | 39,075,854 |

**22. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනය වනවිට ශ්‍රී ලංකා සතොස ශාඛා 250 ක් මෙහෙය වූ අතර, එම දිනට පසුව ශාඛා 46 ක් විවෘත කර තිබේ. ඒ අනුව විගණන වාර්තා දිනය වනවිට ශාඛා 296 ක් මෙහෙයවමින් පවතී.

**23. ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ ගනුදෙනු**

සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් දැනට සමාගමේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සඳහා ඍජුව හෝ වක්‍රව සම්බන්ධකම් නොපවත්වයි.

## සීමාසහිත ලංකා සතොස

2011 දෙසැම්බර් 31 ට දිවයින පුරා ශාඛා ජාලය

1 මීගමුව
2 රත්මලාන
3 පිළියන්දල
4 බත්තරමුල්ල
5 හෝමාගම
6 කිරිබත්ගොඩ
7 හොරණ
8 මීරිගම
9 වේයන්ගොඩ
10 සෙත්සිරිපාය
11 වෙන්නප්පුව
12 මාරවිල
13 රද්දොළුගම
14 මොරටුව
15 හලාවත
16 කටුනායක
17 කොහුවල
18 කොටහේන
19 ගනේමුල්ල
20 අලුත්ගම
21 බණ්ඩාරගම
22 බලංගොඩ
23 රත්නපුර
24 පැල්මඩුල්ල
25 අවිස්සාවේල්ල
26 ඇහැලියගොඩ
27 ඇඹිලිපිටිය
28 බුත්තල
29 කතරගම
30 හම්බන්තොට
31 තංගල්ල
32 බෙලිඅත්ත
33 අම්බලන්තොට
34 තිස්සමහාරාමය
35 අකුරැස්ස
36 මාලිම්බඩ
37 අනුරාධපුර
38 කැකිරාව
39 පින්නදූව
40 පුත්තලම
41 මාතලේ
42 නාරම්මල
43 පොල්ගහවෙල
44 මාලඹේ
45 පොළොන්නරුව
46 කලවාන
47 බදුල්ල
48 ගල්කිස්ස
49 කැලණිය
50 කොළඹ විශ්වවිද්‍යාලය
51 කුරුඳුවත්ත
52 මැකලම් පාර
53 කළුතර
54 නිග්‍රීස්
55 හිඟුරක්ගොඩ
56 දේවාලගම
57 කොටියාකුඹුර
58 අම්පාර
59 කෑගල්ල
60 මතුගම
61 නාවලපිටිය
62 ආනමඩුව
63 පස්සර
64 බණ්ඩාරවෙල
65 යටියන්තොට
66 වැල්ලවාය
67 හික්කඩුව
68 කොටදෙනියාව
69 රක්වාන
70 මැදගම
71 කුලියාපිටිය
72 බොරලැස්ගමුව
73 සමන්තුරෙයි
74 ගම්පහ
75 අතුරුගිරිය
76 මාතර
77 රාගම
78 නිවිතිගල
79 ගම්පොල
80 හෝකන්දර
81 පානදුර 1
82 මහරගම
83 මහබාගේ
84 වොක්ෂෝල් වීදිය
85 පිළියන්දල 2
86 පානදුර 2
87 නෙලුව
88 හක්මන
89 මත්තේගොඩ
90 කිරිඇල්ල
91 මිරිහාන
92 පුඩලුඔය
93 පාදුක්ක
94 හංවැල්ල
95 ජා ඇල
96 ගාල්ල
97 අම්බලන්ගොඩ
98 කොස්ගම
99 වලපනේ
100 කොට්ටාව
101 වවුනියාව
102 වග
103 අරලගංවිල
104 හුණුපිටිය
105 යාපනය
106 පේරාදෙනිය
107 මීගොඩ
108 මාකොල
109 කුරුණෑගල
110 ඇල්පිටිය
111 කඹුරුපිටිය
112 අහංගම
113 දික්වැල්ල
114 මන්නාරම
115 ගොඩගම
116 දෙල්කඳ
117 දිගන
118 කටුගස්තොට
119 රුවන්වැල්ල
120 කඩුවෙල
121 වැලිමඩ
122 මහරගම 2
123 වාරියපොල
124 මැදවච්චිය
125 නාරාහේන්පිට
126 මහනුවර
127 බම්බලපිටිය
128 හබරකඩ
129 නිට්ටඹුව
130 බැලුම්මහර
131 රාගල
132 කරාපිටිය
133 කළුවැල්ල
134 වැලිවේරිය
135 ඇත්ගාල
136 මහව
137 තලවතුගොඩ
138 කහතුඩුව
139 නුවරඑළිය
140 බඩල්කුඹුර
141 ඉමදූව
142 කොටපොල
143 පේදුරුතුඩුව
144 අගුනකොළපැලැස්ස
145 දෙනියාය
146 නාගොඩ
147 රත්මලාන 2
148 මාවනැල්ල
149 වැලිකන්ද
150 සීදූව
151 පුවක්පිටිය
152 මීපේ
153 ගලගෙදර
154 සියඹලාණ්ඩුව
155 සූරියවැව
156 අලව්ව
157 මාකඳුර
158 වැලිපිල්ලෑව
159 මොරවක
160 පන්නල
161 පල්ලෙබැද්ද
162 යක්කල
163 බද්දේගම
164 තඹුත්තේගම
165 මොරොන්තුඩුව
166 තල්දූව
167 බණ්ඩාරවත්ත
168 කහවත්ත
169 ගලගෙදර (මහනුවර)
170 වැල්ලවාය 2
171 ආඩිඅම්බලම
172 ගොඩකවෙල
173 මැණික්හින්න
174 නිකවැරටිය
175 හිඟුරාන
176 උඩුවන
177 පිටිපන
178 දැරණියගල
179 ගල්කිස්ස 2
180 හැටන්
181 තින්දවූර්
182 වාද්දුව
183 බොරලන්ද
184 නොච්චියාගම
185 කිලිනොච්චි
186 රිකිල්ලගස්කඩ
187 ගම්පොල 2
188 පුස්සැල්ලාව
189 තිරුක්කෝවිල්
190 තල්ගස්වල
191 කිරිඳිවැල
192 පූගොඩ
193 දෙබරවැව
194 මිද්දෙනිය
195 පිළිමතලාව
196 හතරලියද්ද
197 කැකණදුර
198 මාළිගාවත්ත
199 නාවින්න
200 කලේගාන
201 මත්තේගොඩ 2
202 පොළොන්නරුව 2
203 මොරටුව 2
204 පිටිගල
205 කොච්චිකඩේ
206 ලුණුගල
207 උහන
208 මැදිරිගිරිය
209 අනුරාධපුර 2
210 හබරාදූව
211 බලගොල්ල
212 තලවාකැලේ
213 මාවරමන්ඩිය
214 මල්ලවපිටිය
215 කටුනායක 2
216 බකමූන
217 වරකාපොල
218 ඉබ්බාගමුව
219 පන්නිපිටිය
220 හෙට්ටිපොල
221 මොණරාගල 2
222 පොකුණුවිට
223 දළුගම
224 මීගමුව 2
225 දිවුලපිටිය
226 කොට්ටාව 2
227 මුල්ලේරියාව
228 ගම්පහ 2
229 කිරිල්ලවල
230 කොට්ටාව 3
231 කුඹුක්ගැටේ
232 බිංගිරිය
233 ඇඹිලිපිටිය 2
234 බෝගහගොඩ
235 අච්චුවේලි
236 ගාල්ල මධ්‍යම බස්නැවතුම්පොළ
237 අම්පාර මධ්‍යම කඳවුර
238 වැලිගෙපොල
239 ඌරගස්මංහන්දිය
240 විලච්චිය
241 කැස්බෑව
242 මිරිහාන 2
243 දෙල්ගොඩ
244 උඩුගම
245 දෙමටගොඩ
246 කටුපොත
247 වැල්ලම්පිටිය
248 පස්යාල
249 වලස්මුල්ල
250 මොණරාගල 3

LANKA SATHOSA
GRACEFULLY FORWARD

# Annual Report 2011




**LANKA SATHOSA LIMITED**

No. 108, 1st Floor, Negris Building,
York Street, Colombo 01.

General Phone No. : 2436301 - 2
Fax : 2437583